**අක්කරෙයිපත්තු මහා නගර සභාව - 2023**
**---------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අක්කරෙයිපත්තු මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.6.1(අ) සහ (ඇ) හි සඳහන් නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2022 හා 2023 වර්ෂයන් සඳහා වූ වරිපනම් බදු වට්ටම් රු.309,326 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වරිපනම් බදු සඳහා වූ වට්ටම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගන්නා බව. | නියමිත කාලයේ වරිපනම් බදු සඳහා වූ වට්ටම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට කපා හරින ලද පොත් 739 ක් සහ වෙන්දේසි කරන ලද අයිතම 434 ක එකතු වටිනාකම රු. 176,776 ක් ස්ථාවර වත්කම් පිරිවැයෙන් අඩු කර දක්වා නොතිබුණි. | ඊළඟ වසර සඳහා වූ ගිණුම් වාර්තාවේ අඩු කිරීමට කටයුතු කරන බව. | වත්කම් වල පිරිවැය නිසි ලෙස හඳුනා ගෙන ගිණුම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2021 සිට 2023 දක්වා කාලය තුළ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පරිත්‍යාග කරන ලද රු.1,334,116ක් වටිනා භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරි වසරේ මූල්‍ය ප්‍රකාශන මගින් මෙම අඩුපාඩු නිවැරදි කරන බව. | පරිත්‍යාග කරන ලද භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.

| | **නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සහා ආඥාපනත, 252 අධිකාරිය | | | |
| | (i) 247 (ඇ) වගන්තිය | මහා නගර සහා බල ප්‍රදේශයට අයත් සංවර්ධනය නොකරන ලද ඉඩම් හඳුනාගෙන ඒවායින් දේපළ | K ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීමේදී සංවර්ධනය නොකරන ලද ඉඩම හඳුනාගෙන ඒ සඳහා | පනත අනුව, සංවර්ධනය නොකරන ලද ඉඩම් හඳුනාගෙන දේපළ බදු අයකර ගැනීමට කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | බදු අය කිරීමට නගර සභාව කටයුතු කර නොතිබුණි. | දේපළ බදු අයකර ගැනීමට ද කටයුතු කරන බව | කළ යුතුය. |
| | (ii) 252 වගන්තිය | වටිනාකම රු. 52,622,490 ක දේපළ බද්ද නොගෙවූ දේපළ හිමිකරුට එරෙහිව ලිඛිත දැනුම්දීමක් සිදුකර අයකලයුතු මුදල අයකිරීමට හෝ දේපළ තහනම් කිරීමට මහා නගර සභාව විසින් කටයුතු කර නොතිබුණි. | දේපළ බදු නොගෙවූ බදු ගෙවන්නන් වෙත රතු නිවේදන යවා ඇති අතර, පනත අනුව බදු අයකර ගැනීමට කටයුතු කරන බව . | පනත අනුව, අයවියයුතු හිඟය කඩිනමින් අයකිරිමට අවශ්‍ය පියවර අනුගමනය කළ යුතුය. |
| (ආ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන සම්බන්ධ විශේෂ විධිවිධාන | 2011 වසරේ තක්සේරු කරන ලද 12,960 ක දේපළ මත පදනම්ව දේපල බදු අයකිරීම් කර තිබුණු අතර, එම දේපළ වසර 05 කට වරක් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | දේපළ ප්‍රත්‍යාගණනය කිරිමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම කර ඇති අතර, එම ක්‍රියාවලිය අවසන් වූ පසු, ප්‍රතිශෝධිත දේපල බද්ද අයකිරිමට කටයුතු කරන බව. | පනත අනුව නිශ්චල දේපළ වසර 05කට වරක් තක්සේරු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1),(2),(3) | වසර දෙකකට වැඩි රු. 1,695,738ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 86ක් පැවතිද, එම මුදල අදාළ පුද්ගලයන්ට ලබාදීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල මෙම අඩුපාඩු නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි අනුව, කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධ ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 32,126,681 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 22,325,733 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 18,253,530 | 74,851,791 | 7,475,946 | 67,375,845 | 16,953,530 | 60,981,177 | 8,358,686 | 52,622,490 |
| (ii) | කුලී | 31,837,148 | 41,007,058 | 17,768,544 | 23,238,514 | 23,470,608 | 35,876,692 | 12,578,997 | 23,297,695 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 10,200,000 | 4,046,200 | 4,034,000 | 12,200 | 5,200,000 | 3,475,500 | 3,475,500 | - |
| (iv) | වෙනත් ආදායම් | 44,015,000 | 47,158,170 | 47,158,170 | - | 41,850,000 | 82,203,621 | 82,203,621 | - |
| (v) | එකතුව | 104,305,678 | 167,063,219 | 76,436,660 | 90,626,559 | 87,474,138 | 182,536,990 | 106,616,804 | 75,920,185 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව පැවති දේපළ බදු රු.67,375,845 ක් වූ අතර එයින් රු. 55,839,877 ක මුදලක් වසර 01 සිට 08 දක්වා කාලයක සිට හිඟව පැවතුණි. | ආදායම් පරීක්ෂකවරුන් නොමැතිකම හේතුවෙන් ලැයිස්තුගත ආදායම් හිඟ නොමැතිව අයකිරීමට නොහැකි වන අතර, ඉදිරියේදී ආදායම් එකතුකිරීමේ නිලධාරීන් පත්කර හිඟ අයකර ගැනීමට පියවර ගන්නා බව. | අයවිය යුතු හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | බදුකරුවන් 150 දෙනෙකුගෙන් අයවියයුතු හිඟය රු. 13,685,441 ක් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් නොගෙවන්නන්ට විරුද්ධව නීතිමය පියවර ද හඳුනාගත නොහැකි ණයගැතියන්ගේ හිඟය කපාහැරීමට අදාළ කටයුතු ද සිදුකර ඇති බව. | -එම- |
| (ii) | 1992 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාළව බදු කරුවන්ගෙන් ලැබිය යුතු එකතුව රු.8,413,702 මුදල සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | සමාලෝචිත වර්ෂය සඳහා ජේසීබී, ටිපර්, ගලි බවුසර්, Excavater සහ අනිකුත් යන්ත්‍රවලින් කුලි ආදායම් ලෙස රු. 4,250,000ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණ ද රු. 106,000ක් පමණක් ආදායම් ලෙස උපයාගෙන තිබුණි. තවද, මෙම යන්ත්‍ර සහිත වාහන කුලියට ලබා දීම සහ සභාවේ එදිනෙදා කටයුතු වල යෙදවීම වැනි කරුණු ඇතුළත් ක්‍රමවත් ලේඛන පවත්වා නොතිබුණි. මේ නිසා යන්ත්‍රවලින් ලද කුලී ආදායම, ලද අත්තිකාරම්, ලැබියයුතු හිඟ, භාවිතා කල යන්ත්‍ර පැය ගණන්, භාවිතා | ඉල්ලීම් අඩුවෙන් තිබීමෙන් සහ කුලියට ලබා නොදීමෙන් ආදායම් අඩුවී තිබුණි. මෙම වර්ෂයේ වාහනවල කුලී ආදායම වැඩි කිරීමට කටයුතු කර ඇති බව. | වාහන කුලී පිළිබඳ විස්තරාත්මක ලේඛන පවත්වා ගැනීමටත්, වාහන සඳහා වන වියදම් පියවා ගත හැකි අයුරින්, ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කල ඉන්ධන ප්‍රමාණ යනාදියේ සත්‍ය තත්ත්වය විගණනයේදී සනාථ කිරීමට නොහැකිවිය. | | |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා කඩකාමර 739 කට ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ලෙස රු. 3,330,000 ක් අයකර ගෙන තිබුණද, එයින් ව්‍යාපාර ආයතන 189 කට පමණක් වාර්ෂික ව්‍යාපාර බලපත්‍ර සහතික ලබා දී තිබුණි. | ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ගෙවූ අයට සහතික නිකුත් කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | වර්ෂයට අදාළ බලපත්‍ර නිසි පරිදි ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ii) | දැන්වීම පුවරු සම්බන්ධයෙන් විස්තරාත්මක ලේඛන පවත්වා ගෙන නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දැන්වීම පුවරු 130ක ගාස්තු ලෙස රු. 305,250 ක මුදලක් අයකර තිබූ නමුත්, අතුරු ව්‍යවස්ථා හෝ අනුමැතිය ලබා ඇස්තමේන්තු කරන ලද රු. 3,500,000 ක ආදායම් සම්පූර්ණයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ලේඛනයේ දැන්වීම පුවරු ගාස්තු විස්තර ඇතුළත් කිරීමටත්, ඉදිරියේ දී අතුරු ව්‍යවස්ථා සකස් කර අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කර ඇති බව. | අතුරු ව්‍යවස්ථා සකස් කර අදාල අනුමැතිය ලබා ගෙන ආදායම් සම්පූර්ණයෙන් අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | එයාර්ටෙල්, මොබිටෙල් සහ ඩයලොග් යන සම්ප්‍රේක්ෂණ කුළුණු සඳහා 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා හිඟ කුලිය රු. 770,657 ක් පැවැතියද එය අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟය ගෙවා අවසන් කරන ලෙස ආයතන වලට දැනුම් දී ඇති බව. | හිඟ ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | 2021 සිට 2023 වර්ෂය දක්වා අය වැය ඇස්තමේන්තුවේ විශේෂ සණ අපද්‍රව්‍ය බැහැර කිරීම් ගාස්තු ලෙස රු. 1,000,000ක් ඇස්තමේන්තු කර තිබුණ ද, අයකිරීම් රු. 74,500 සිට රු. 144,500 දක්වා පරාසයක පැවතුණි. | ප්‍රවර්ථන වර්ෂයේ ව්‍යාපාර බලපත්‍ර ගාස්තුවෙන් අධික මුදලක් විශේෂ සණ අපද්‍රව්‍ය බැහැර කිරීම් ගාස්තු ලෙස අයකිරීමටද කටයුතු කර ඇති බව. | විශේෂ සණ අපද්‍රව්‍ය බැහැර කිරීම් ගාස්තු ආදායම් ඇස්තමේන්තුව හැකිතාක් සත්‍ය දත්ත හා පසුගිය ආදායම් යනාදිය සැලකිල්ලට ගෙන නිවැරදිව ඇස්තමේන්තු කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඉ)** | 2020 වර්ෂය සිට 2022 වර්ෂය දක්වා කාලයට ලැබිය යුතු රු. 812,550 ක මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉල්ලීම් කර ඇති බව. | අයකළ යුතු ආදායම් කඩිනමින් අයකිරීමට කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනම ආදායම් අංශයක් ස්ථාපිත කර ආදායම් අයකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන ආදායම් ලෙස රු. 117,805,679ක් ඇස්තමේන්තු කර තිබුණ ද සමග මුලු අයකිරීම් රු. 59,982,745ක් විය. ඒ අනුව අයකිරීම් ප්‍රතිශතය සියයට 50ක ප්‍රතිශතයක් විය. | මූල්‍ය අර්බුදය යථාතත්වයට පත්වූ පසු වෙනම ආදායම් අංශයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නා බව. | ආදායම් අංශයක් ආරම්භ කර අයවැයගත ආදායම සම්පූර්ණයෙන් අය කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) | මහා නගර සභාව සතු සහ භාවිතා කරනු ලබන ඉඩම් ගොඩනැගිලි 28 ක සහ මෝටර් රථ 60 ක වටිනාකම නැවත තක්සේරු කර එහි සත්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි සහ වාහනවල වටිනාකම නැවත තක්සේරු ක්‍රියාවලිය කඩිනම් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | කඩිනමින් නැවත තක්සේරු කර සත්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2011 වර්ෂයේ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සේවකයෙකුට සහ ප්‍රජාශාලා මධ්‍යස්ථානයක නිලධාරියෙකුට ලබා දී තිබූ රු. 106.003 ක අත්තිකාරම් 02 ක් අයකිරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ශේෂයන් කපා හැරීමට මූලික කටයුතු සිදු කර ඇති බව. | අත්තිකාරම් ලෙස ගෙවූ මුදල අයකිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඈ) | සේවක අර්ථසාධක දායක මුදල් රු. 285,600 ක් සහ සේවක භාරකාර දායක මුදල් රු. 26,930 ක් අදාළ අරමුදල් නොගෙවා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | අදාල ආයතනයට ප්‍රවර්තන වර්ෂයේ දී යැවීමට කටයුතු කර ඇති බව. | දායක මුදල් අදාළ අරමුදල් වෙත කඩිනමින් ප්‍රේෂණය කළ යුතුය. |
| (ඉ) | කඩකාමර කුලි මුදල කාලීනව තක්සේරු නොකර 2011 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව මාසිකව රු. 1,000 සිට රු. 5,250 දක්වා වන පරාසයකට කඩකාමර කුලියට ලබා දීම නිසා දළ වශයෙන් රු. 10,000,000ක ආදායම වාර්ෂිකව සභාවට අහිමි වෙමින් පැවතුණි. | තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති බව. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව, කුලිය කාලීනව තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ 2017 වසරේ මහා නගර සභාවට ලැබී තිබුණු විද්‍යුත් ප්‍රචාරක රූපවාහිනිය 2019 වසරේ අක්‍රීයව පැවතුණද, එය | ප්‍රවර්ථන වර්ෂය තුළ අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | විද්‍යුත් ප්‍රචාරක රූපවාහිනිය අලුත්වැඩියා කර ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අලුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීමෙන් මහා නගර සභාවට එමගින් වාර්ෂිකව රු. 350,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | | |
| (උ) | 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා බැංකු ජංගම ගිණුමේ ශේෂය රු. 18,342,000 ක් තිබුණද, සභාවට ආදායම් ලබාගතහැකි මාර්ගවල ආයෝජනය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉතිරිව පවතින ජංගම ගිණුමේ ශේෂය Money Market / Overnight නම් වූ ඉතුරුම් ගිණුමක් අක්කරෙයිපත්තු ලංකා බැංකුවේ ආරම්භ කිරීමට කටයුතු කර ඇති බව. | අතිරේක මුදල නිසි අවසරය ඇතිව ආදායම් ඉපයීමේ මාර්ගවල හෝ ආයතනයේ මෙහෙයුම්වලට යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සීසෑමේ යන්ත්‍ර 03ක්, ටේලර් 08ක් සහ යතුරුපැදි 03ක් භාවිතයට නොගෙන පවතින අතර ඒවා අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කළ නොහැකි වාහන අදාළ දෙපාර්තමේන්තුවලින් අනුමැතිය ලබාගෙන වෙන්දේසි කිරීමටත්, අනෙක් වාහන එකින් එක අලුත්වැඩියා කරමින් පවතින බව. | වාහන අලුත්වැඩියා කර නැවත භාවිත කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජල සම්බන්ධතා ලබා ගැනීම සඳහා ප්‍රතිලාභීන් 165 දෙනෙකු විසින් කැපූ කොන්ක්‍රීට්, තාර සහ බොරළු පාරවල් ප්‍රතිසංස්කරණය කිරීමට මහා නගර සභාවෙන් රු. 1,345,500ක් අයකර තිබුණද , එම මාර්ග යථා තත්ත්වයට පත් කර මාර්ගය ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | තැන්පත් මුදල් යොදවා යථා තත්ත්වයට සකස් නොකළ මාර්ග පිළිසකර කිරීමට පියවර ගන්නා බව. | කැපූ මාර්ග යථා තත්ත්වයට පත් කර මාර්ග ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වසර 03කට වැඩි කාලයක් ව්‍යායාම් මධ්‍යස්ථානයේ පවතින ශාරීරික යෝග්‍යතා උපකරණ 03ක් අලුත්වැඩියා කර කුලියට ලබාදීමට මහා නගර සභාව කටයුතු කර නොතිබුණි. | ව්‍යායාම මධ්‍යස්ථානයේ පවතින අබලන් උපකරණ පිළිසකර කිරීමට කටයුතු කර ඇති බව. | උපකරණ අලුත්වැඩියා කිරීමට පෙර තක්සේරු වාර්තාව සහ වෙළඳපල වටිනාකම සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පොත් සංගණනය සඳහා ඉදිරිපත් නොකළ පොත් 796ක අලාභ වටිනාකම අදාළ පුද්ගලයින්ගෙන් අයකර ලියා හැරීමටත් හානියට පත් පොත් සම්පූර්ණයෙන්ම ලියාහැර ඒ වෙනුවට නව පොත් ලබා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව | භාණ්ඩ සමීක්ෂණයට ලක් නොකළ පොත් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සභාවෙන් ණය ලබාගෙන මියගිය සහ වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ණය රු. 441,900 ක් අදාළ නිලධාරින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකිරීමට කටයුතුකර නොතිබුණි. | හිඟ ණය ගෙවා අවසන් කරන ලෙස ලිපි මගින් දැනුම් දී ඇත, අක්කරෙයිපත්තුව ප්‍රාදේශීය සභා කාලසීමාව තුළ තිබූ හිඟ ණය ශේෂ කපා හැරීමට කටයුතු කරන බව. | නිලධාරින්ගෙන් අයවිය යුතු හිඟ ණය මුදල් අදාළ පුද්ගලයන්ගෙන් හෝ ඇපකරුගෙන් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය අඩ්ඩාලචේන ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානයට ලබා දීමේදී දිරණ කසළ ටොන් එකකට රුපියල් 200 බැගින් ද නොදිරණ කසළ ටොන් එකකට රුපියල් 300 බැගින් ද ගෙවා තිබුණද කසල වෙන්කර ලබා නොගැනීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ටොන් 3,573ක් නොදිරණ කසළ සේ සළකා රු.1,072,199ක් ගෙවා තිබුණි. | දිරණ කසළ අඩුවෙන් ලැබෙන බැවින් කසළ අඩ්ඩාලචේන ප්‍රාදේශීය සභාවට ලබා දෙන බැවින් ප්‍රවාහන වියදම් අධික වේ. නමුත්, මේ වන විටත් ජනතාවගේ විරෝධය මධ්‍යයේ දිරණ කසළ ද අප සභාවේ කසළ රැස්කරන ස්ථානයට එකතු කර ඇති බව. | කසළ නිසි ලෙස වෙන් කර ලබාගැනීමටත්, කාබනික පොහොර නිෂ්පාදනය කිරීමටත්, වියදම් අවම කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාව භාවිතා කරන ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය, සෝතකාගාරය යනාදියට සමාලෝචිත වර්ෂය දක්වා පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රවර්ථන වර්ෂයේ දී පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව. | පාරිසරික බලපත්‍ර ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

**4.3 මූල්‍ය ප්‍රතිපාදන නොසැපයීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ භාණ්ඩ බහාලුම් 03 ක් රු. 5,910,000 කට මිලදී ගෙන තිබුණද මෙම වෙළෙඳසැල්වල සාමාන්‍ය පාරිභෝගික ජනතාවගේ ප්‍රයෝජනය සඳහා මූලික පහසුකම් සළසා ලබාදීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ බහාලුම් වෙළඳසැල් මිල කැඳවා ලබාදීමට පියවර ගෙන තිබුණද, පෙන්වා දී ඇති අඩුපාඩු සපුරාලීමට 2024 දී ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කටයුතු කරන බව. | කඩිනමින් අවශ්‍යතා සම්පූර්ණ කර කුලියට ලබා දීමට කටයුතු කළ යුතුය. |

**4.4 අපේක්ෂිත ඉලක්ක ළඟාකර නොගැනීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ විද්‍යුත් පුස්තකාලයක් වශයෙන් රු. 2,848,078ක වියදමින් මහජන පුස්තකාලය 2022 වර්ෂයේ පිහිටුවා තිබුණ ද මෙය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංග, සේවර්, තීරු කේත කියවනය සහ තීරු කේත මුද්‍රණ යන්ත්‍රය වැනි විද්‍යුත් උපකරණ පහසුකම් නොමැතිකම හේතුවෙන් මෙම ක්‍රියාවලිය අත්හැර දමා තිබුණි. | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ විද්‍යුත් පුස්තකාලය සඳහා යටිතල පහසුකම් සහ පරිගණක පහසුකම් පමණක් ලබා දී තිබුණි. අනෙකුත් උපකරණ සහ මෘදුකාංග මහා නගර සහා අරමුදලින් මිලදී ගැනීමට සිදුවී තිබුණ බව. | විද්‍යුත් පුස්තකාලයේ අරමුණ ළඟාකරගත හැකි අයුරින් ඉතා කඩිනමින් කටයුතු කළ යුතුය. |